# <u>මේ, අස්වනු නෙළා ගැනීමේ කාලයයි.</u>

විධායක ජනාධිපති ධුරය ඇති කළ දා සිට අද දක්වා, පාර්ලිමේන්තුව විධායකයේ අතකොළුවක් නො වූ කාලය නො ව, ''නො වී සිටීමට තැත් කළ කාලය'' කොපමණ ද? හතර අවුරුද්දක් වත් නැත. ඒ, රනිල් වික්‍රමසිංහ අගමැති වූ කාලයයි. එසේ වුණේ, රනිල් වික්‍රමසිංහ හොඳ මහත්මයෙක් වූ නිසා ද? නැත් නම්, එක්සත් ජාතික පක්ෂය යහපත් පක්ෂයක් වූ නිසා ද? නැත. රනිල් වික්‍රමසිංහ හෝ ඔහුගේ පක්ෂය ඒ වන විට විධායක ජනාධිපති ධුරයේ නො සිටි නිසා ය. මේ නිසා, පාර්ලිමේන්තුව යනු, පවතින ක්‍රමය තුළ ජනාධිපති ගේ අභිමතය සාධනය කෙරෙන ආයතනයකට වැඩි යමක් නොවේය යන්න,

ජනාධිපතිවරයා හැරුණු කොට අනිත් සියල්ලන් ම මේ වන විට පිළිගත යුතු සරළ සත්‍යයකි. එහෙත් එය නිවැරදි කර ගැනීම සඳහා මේ ක්‍රමය වෙනස් කරන දිසාවක් වෙනුවෙන් පෙනී සිටින කිසි පක්ෂයක් අද ලංකාවේ නැත. හේතුව, ඒ හැම පක්ෂයක් ම සහ නායකයෙකු ම, අද බැරි නම් හෙට හෝ ඒ ධුරය දැරීමේ කෑදර ලෝලයෙන් පෙළෙන නිසා ය.

පළාත් සභා ක්‍රමය යනු ජාතික ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් දේශපාලන බලය විමධ්‍යගත කිරීමේ අවම සැලසුමකි. පසු ගිය විසි අවුරුද්ද තුළ මේ ක්‍රමය මගින් සැබෑ බලයක් විමධ්‍යගත කෙරුණු කිසි පළාතක් තිබේ ද? නැත. එහෙත් මිනිමරා ගෙන හෝ ඒ ක්‍රමයේ බාහිර ක්‍රියා පරිපාටිය පවත්වා ගැනීමට මුළු රට ම අඩු වැඩි වශයෙන් සම්මාදම් වී ඇත.

විධායක ජනාධිපති ක්‍රමය හරහා සමස්ත ජනතාව ගේ ස්වෛරීත්වය සහ ස්වාධීනත්වය තනි පුද්ගලයෙකු ගේ අණසක යටතට උදුරාගෙන තිබෙන අතරේ පළාත් සභා ක්‍රමය හරහා අප මේ සෙල්ලම් කරන්නේ රටේ සුළු ජාතියේ සකල අයිතිවාසිකම් සමග ය. ජනාධිපති ක්‍රමය හොඳ ද නරක ද යන්න තමන් ගේ ප්‍රශ්නයක් වශයෙන් උතුරු නැගෙනහිර ජනයා තව දුරටත් සළකන්නේ නැත. එහෙත්, තමන් ගේ අයිතිවාසිකම් නාමයෙන් ක්‍රියාත්මක කෙරෙන සැනසිලි තෑග්ගක් පවා, තමන් ගේ නො වන බහුතර බලයේ ම අභිවෘද්ධිය පිණිස, විවෘතව ම සහ මහ දවල් ම යෙදවෙන්නේ නම්, ඒ බහුතරයේ සෙල්ලමින් වෙන් ව විසීම ස්වකීය අභිවෘද්ධිය පිණිස වේ යැයි එම සුළුතර වැසියන් සිතීම අස්වභාවික නැත. අද අප මුහුණදෙන යුද්ධය යනු, මේ සෙල්ලමින් විනෝද වන සහ මේ සෙල්ලමින් බැටකන මිනිසුන් අතර ඇති විරසකය යි.

**යුද්ධය යනු, එකිනෙකින් විලෝපනය වන අතරේ එකිනෙකා පෝෂණය කරන ද්විත්ව දෘෂ්ටිවාදයක පිටුබලය ලත් සමාජ සම්බන්ධතාවයක් මිස වෙන කිසිවක් නො වන වග අප තේරුම් ගත යුතු ය. එහෙත් දකුණට තව මත් එය, තමන් ගේ නො වන හෙවත් තමන් ගෙන් පිටස්තර තිරිසනෙකු**

විසින් තමන් මත පටවා ඇති බාහිර කාලකණ්ණිකමක් පමණි. විදේශ රටවල ජීවත් වන බොහෝ ලාංකිකයන්, ලංකාව ගැන කතා කිරීමේ දී, 'අර හැත්ත (කොටි) නැත් නං ලංකාව කොච්චර ලස්සණ රටක් ද' කියා විමසන්නේ එ බැවිනි.

මෙ සේ ප්‍රශ්නය ග්‍රහණය කර ගත් කල, එහි ඊ ළඟ තේරුම් ගැනීමේ අදියර එළැඹෙන්නේ මෙ සේ ය. තමන් නො වන ඒ 'පිටස්තරයා' වනසා දැමීමෙන් මිස තමාගේ 'පැවැත්ම' සහතික කෙරෙන වෙනත් මගක් නැත්තේ ය. පිටස්තරයා සහ තමා එක පෙකෙණි වැලකින් ගැට ගැසී ඇති බව සහ ඒ පිටස්තර අනිකා ගේ නො පැවැත්ම විසින් එක එල්ලේ ම තමා ගේ නො පැවැත්ම ද ඉෂ්ට සිද්ධ කරන බව ඔහුට නො වැටහේ. අප වැනි අහිංසක මහ ජනතාවගෙන් පිටස්තර, අපේ කිසි නෑකමක් හෝ ඇයි හොඳයියක් නැති, 'ත්‍රස්තවාදී උවදුර' මේ ධරණී තලයෙන් අතුගා දැමීමට, චම්පික රණවක සහ විමල් වීරවංශ ප්‍රමුඛ රාජපක්ෂ රජයේ මහින්ද චින්තනය පෙරමුණ ගෙන ඇත්තේ ඒ වෙනුවෙනි.

කිලිනොච්චියට බෝම්බ දැමීම පමණක් යුද්ධය වශයෙන් තේරුම් ගෙන සිටි ජනතා විමුක්ති පෙරමුණට, එම යුද්ධයට ගෙවන මිළක් වශයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය දකුණෙන් අහිමි කෙරෙන බව, පිට පිට දෙවතාවක් ම ආරච්චි කට්ටුවේ දී පහර දීමෙන් රාජපාක්ෂිකයෝ කියා දුන් හ. යුද්ධයට විරුද්ධ නැති, එහෙත් යුද්ධය හරියට නො කරනවාට විරුද්ධ ඉක්බාල් අත්තාස් සහ කීත් නෝයර් වැනි 'ස්වාධීන' මාධ්‍යවේදීහු අද වන විට යුද්ධය තමන්ට බලපාන ආකාරය පෞද්ගලිකව අත්විඳීමින් සිටිති. හුලුගල්ල නැමැති මහතෙක් රජයේ සේවකයන්ට දේශපාලනය කිරීමේ අයිතියක් නැති බව පසු ගිය දා ප්‍රසිද්ධ පංතියක් තබා කියා දුනි. දැන්, සබරගමුව සහ උතුරු මැද පළාත් සභා ද විසිරුවා හැර ඇත. ඒ පළාත්වල ජනතාව ගේ ගෙයි එළිපත්තට ම බලය විමධ්‍යගත කර දීමට ද, ඒ?

මතට තිත සහ සංස්කෘතික පොලිස් වාරණවලට අමතරව, මහින්ද චින්තනය දේශපාලන ශික්ෂාවන් ද සමාදම් වෙයි. නැගෙනහිර පළාත් සභා චන්දයට ආණ්ඩුව ගියේ එ වැනි දේශපාලන ශීලයක් පෙරට දමමිනි. මෙය කපටි උපාසකයෙකු ගේ හොර ශීලයක් බව තේරුම් ගැනීමට ඕනෑ තරම් සාක්ෂි තිබුණි. ත්‍රස්තවාදි උවදුරෙන් විශාල පදාසයක් දුරිභූත කළ බවට දේශපාලන සහතිකයක් ලබා ගැනීමට අමතරව, දුර්දාන්ත පාලනය සනාථ කර ගැනීමත් එම චන්දයේ ඍජු ඉලක්ක වශයෙන් පැවතුණු බව පැහැදිලි ය. එහෙත් එක්සත් ජාතික පක්ෂය ඇතුළු විරුද්ධ පක්ෂ එම චන්දයට සහභාගී වීමෙන් ඒ සහතිකය නො මිලේ ම ආණ්ඩුවට එදා ප්‍රදානය කෙළේ ය.

අළුතෙන් පිහිටැ වූ නැගෙනහිර පළාතට බලය බෙදා හැරීමක් සිදු විණි ද යන ප්‍රශ්නය අද නැගෙන්නේ ම නැත. ඇත්තෙන්ම ඒ ප්‍රශ්නය තව දුරටත් රටට අදාළ නැති ගාන ය. ආණ්ඩුවත්, විරුද්ධ පක්ෂත් තවමත් ඒ නැගෙනහිර පළාත් සභා මැතිවරණය තොරොම්බල් කරන්නේ, ආණ්ඩුව

වෙනුවෙන් ඇතැ යි හෝ නැතැ යි කියන ජනතා වරම පිළිබඳ තර්කනයක් වශයෙන් පමණි. ආණ්ඩුව එය තමන් ගේ ජනතා වරම පෙන්නුම් කිරීමට යොදා ගන්නා අතර විරුද්ධ පක්ෂ කරන්නේ එය ආණ්ඩුවේ භීෂණය සහ දූෂණය මූර්තිමත් කළ තවත් අවස්ථාවක් වශයෙන් ගෙනහැර පෑමයි.

වැපිරූ දෙයක් මිස වෙනත් දෙයක් නෙළා ගන්නට පිළිවන් කමක් අපට නැත. නැගෙනහිරින් පටන් ගත් සෙල්ලම දැන් සබරගමුවට සහ උතුරුමැදට යයි. මේ සභා දෙකේ ම වාරය අවසන් වීමට තව අවුරුද්දකටත් වැඩි කාලයක් ඇත. එහෙත් ජනාධිපතිවරයාට අනුව, අවුරුද්දක් නො ව, තව අවුරුදු සීයක් ලියා තිබුණත්, තමන්ට අවශ්‍ය අද නම්, එය අද කළ යුතු ය. පොලිස් කොමිසමක් හෝ මැතිවරණ කොමිසමක් නැත. ඒවා මේ සෙල්ලමට අවශ්‍ය නැතැ යි ජනාධිපතිවරයා කියන විට අපිත් ඊට 'ඔව්' කියමු. 'බැහැ' කියමින් හෝ සෙල්ලමට සහභාගී වෙමු. අවශ්‍ය කරන්නේ, සෙල්ලම නොමරා පවත්වා ගැනීමයි.

විඳවීම වින්දනයක් කර ගත් ජාතියක් කාලයක දී නිර්වින්දනය වන්නේ ය. අප අද ඉතා වේගයෙන් ගමන් කරමින් සිටින්නේ ඒ මාර්ගයේ ය. බෝම්බ දෙකක් අතර වෙනස අර්ථ කථනය කෙරෙන්නේ, ඒ බෝම්බවල කෘෘරත්වය හෝ විනාශකාරීත්වය උඩ නො ව, ඒවා අහසින් වැටෙන බෝම්බ ද, පොළොවෙන් පුපුරා යන බෝම්බ ද යන්න මත ය. වන්නි අහසින් පතිත වන බෝම්බ ගැන අහ්ලාදයෙන් කතා කරන අතරේ, දෙහිවල දී හෝ කටුබැද්දේ දී පුපුරන බෝම්බ ගැන අපට කම්පා විය හැක. කුපිත විය හැක.

මේ අවුරුද්ද අවසන් වීමට ඇත්තේ තව මාස හයකි. උමග කොණේ එළියක් ඇතැ යි අපි විශ්වාස කරමු. අවබෝධය නැති තැන විරාජමාන වන්නේ විශ්වාසයයි. බොහෝ විට, එය අන්ධ ය.

email : gviyangoda@hotmail.fr